

# ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය

**අධ්‍යාපන ලැබීමට විවිධාකාර මාර්ග ඇත. එහෙත් ශ්‍රී ලාංකීය සමාජය තුළ පාසල් හා විශ්ව විද්‍යාල අධ්‍යාපනය හැර විකල්ප අධ්‍යාපන ක්‍රමවේදයක් ප්‍රචලිතව ඇත්නම් ඒ පරිගණක අධ්‍යාපනය පමණි. කෙසේ වෙතත් වර්තමානයේදී කාර්මික අංශය කෙරෙහි තරුණ තරුණියන් ඇදීයාමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.**

අද ලොව අධි තාක්ෂණික යුගයක පසුවන බැවින් කාර්මික දැනුමට අමිල වැදගත් කමක් නිතැතින්ම හිමි වෙයි. එහි අගය දිනෙන් දින ඉහළ යන බවට විවාදයක් නැත.

එසේනම් අප අධ්‍යාපන රටාව කාර්මික අංශය කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්විය යුතු ය.

කාර්මික අධ්‍යාපනය උදෙසා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති අභ්‍යාස ආයතන අතර ජාතික ආධුනිකත්ව මණ්ඩලය, වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරිය, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය ආදී ආයතන ප්‍රමුඛ වෙයි.

ශ්‍රී ලාංකීය කාර්මික ක්ෂේත්‍රයේ දැනුම වඩා ඵලදායී ලෙස හා ගුණාත්මක ලෙස ඉහළ දැමීම උදෙසා ඉමහත් සේවාවක් සිදු කරන 'ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය' පිළිබඳ විමසීමක් මේ.

1958 වර්ෂයේදී ජර්මන් පෙඩරල් සමූහාණ්ඩුව හා ලංකා රජය අතර ඇති කර ගත් ගිවිසුමක් අනුව, 1959 දී ලංකා ගමනාගමන මණ්ඩලයට අනුබද්ධිතව ගමනා ගමන මණ්ඩල වේරහැර මධ්‍යම වැඩපළ භූමියේ මෙම ආයතනය ස්ථාපිත කෙරිණි. එවක ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ අරමුණු වී ඇත්තේ ලංගම බස් රථ නිෂ්පාදනයට හා අලුත්වැඩියාවට කාර්මිකයන් පුහුණු කිරීමයි.

## විදුහල්පතිතුමාගෙන් වචනයක්




ලිපිකරු වෘත්තිකයන් බිහිකරීමේ කාර්යය මත පදනම් වූ අධ්‍යාපන ක්‍රමය අප අහෝසි කළ යුතුයි. අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේ උවමනාව මත මෙරට ගොඩනැගූ එම අධ්‍යාපන ක්‍රමයට අප තවමත් ගැති වී සිටිනවා.

නව නිර්මාණාත්මක හැකියාවෙන් පිරිපුන් සමාජයක් අප ගොඩනැගිය යුතුයි. අප අභ්‍යාස ආයතනයේ අරමුණ වන්නේ නවීන තාක්ෂණය ඔස්සේ නිර්මාණාත්මක කාර්යයන් සඳහා සිසුන් හුරු කිරීමයි.

අප ආයතනය පාඨමාලා කාලයෙන් සියයට 80 ක් ම ලබා දෙන්නේ ප්‍රායෝගික පුහුණුවයි. සෛද්ධාන්තික පුහුණුව සඳහා පාඨමාලා කාලයෙන් සියයට 20 ක් පමණයි යොද ගනු ලබන්නේ. එතුළින් ඉහළ දැනුම් මට්ටමක් හිමි කාර්යශූර වෘත්තිකයන් බිහි කිරීමට අපට අවස්ථාව ලැබී තිබෙනවා. ලොව සිව් දෙසින් අප වෘත්තිකයන් සඳහා නිරන්තර ඉල්ලුමක් ඇත්තේ එනිසයි.

ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ තිබූ අප ආයතනය 2004 අප්‍රේල් මස දී "නිපුණතා සංවර්ධන වෘත්තීය හා කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය" යටතට පත්ව තිබෙනවා.

ඉන්දිය කාර්මික ආයතනයන්හී පුහුණුව අවසන් කරන්නන් හට සහන ගාස්තු මත ණය මුදල් ලබා දෙනු ලබනවා. ඒ ඔවුන්ට ස්වයං රැකියා ආරමං කිරීම සඳහායි. ශ්‍රී ලංකාව තුළ ද එවැනි ක්‍රමයක් ඇති කළ හොත් හෙට ලොවට ගැලපෙන අනාගත පරපුරක් බිහි කිරීමට රුකුලක් වනු ඇත.



වයස අවුරුදු 16-18 අතර වූ සිසුන් හැට (60) දෙනෙකුගෙන් ද ජර්මන් හා ශ්‍රී ලාංකික කාර්මික උපදේශකයන් විසි හතර (24) දෙනෙකුගෙන් ද සමන්විතව ආයතනයේ ප්‍රථම අධ්‍යයන වාරය ආරම්භ කරනු ලැබීය.

මොරටුව කටුබැද්දෙහි මෙම ආයතනය ස්ථාපනය කර ඇත්තේ 1974 වර්ෂයේ දී ය. අභ්‍යාස ආයතනයේ අරමුණු පුළුල් කරමින් කාර්මික ක්ෂේත්‍රයේ විවිධ අංශයන් කරා යොමුවීම මෙහිදී සිදු වුණි.

ඒතැන් පටන් ක්‍රමයෙන් වැඩිදියුණු වූ මෙම ආයතනය සිය රජත ජයන්ති උත්සවය 'යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා බල විදුලි කර්මාන්තශාලා පුහුණු වන්නන් සඳහා කම්හලක් විවෘත කරමින් සමරා ඇත. මෙහිදී නවත් විශේෂිත දෙයක් සිදු විය. එනම් මෙතෙක් කලක් සිසුන්ට පමණක් විවෘතව තිබූ අධ්‍යයන කටයුතු සඳහා සිසුවියන්ට ද සහභාගි වීමට කටයුතු සම්පාදනයට මුල පිරීමයි.

මෙතෙක් පවත්වාගෙන ආ පූර්ණ කාලීන හෙවත් මුදල් අයකිරීමකින් තොරව පවත්වන පාඨමාලා සඳහා බඳවා ගන්නා පිරිස සීමා සහිත වූ නිසා වැඩි පිරිසකට අවස්ථාව ලබා දීමේ අරමුණින් 1979 වර්ෂයේ දී අර්ධ කාලීන පාඨමාලා ආරම්භ කෙරිණි.

## පූර්ණකාලීන පාඨමාලා


මෙම පාඨමාලා පවත්වන කාල ප්‍රමාණයන් අවුරුදු 3, 3 1/2, 4 ලෙස විවිධ ය. අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් වන්නේ ගණිතය හා මව්බස ඇතුළුව අ.පො.ස. සාමාන්‍ය පෙළ එකවිට විෂයන් හයකින් සමත් වීම ය. (සෑම වසරක ම අප්‍රේල් මස මුල දී අ.පො.ස. සාමාන්‍ය පෙළ ප්‍රතිඵල නිකුත් වීමෙන් පසු පුවත්පත් හා ගැසට් පත්‍රයේ දැන්වීම් මගින් අයැදුම්පත් කැඳවනු ලැබේ.) සුදුසුකම් සපුරන අයදුම්කරුවන් ජූනි මසදී තරග විභාගයකට යොමුකර සමත්වන පිරිස සම්මුඛ පරීක්ෂණයකට ලක්කර වර්ෂය සඳහා බඳවා ගන්නා ප්‍රමාණය තෝරා ගනු ලබයි.

තෝරා ගත් පිරිසකට පළමු වසර තුළ දී න්‍යායික හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් පවත්වනු ලබයි. මෙහිදී කර්මාන්ත ශාලාවක භාවිත වන උපකරණ පිළිබඳ මූලික දැනුම ලබාදීම සිදු කරයි. මෙය ආයතනය තුළින් පවත්වන සියලු පාඨමාලා සඳහා මූලික දැනුම ලබා දෙන ක්‍රියාවලිය ලෙස හැඳින්විය යුතුය. එක් අවුරුදු පාඨමාලාවෙන් පසු පරීක්ෂණයක් පවත්වනු ලබයි. එයින් හිමි ලකුණු මට්ටම අනුව එක් එක් පාඨමාලා සඳහා අනුයුක්ත කරනු ලැබේ.

මෙහිදී සිසුවාගේ කැමැත්ත ද සලකා බලනු ලබයි. දෙවැනි වසර තුළදී තම පාඨමාලාව ආයතනික ක්‍රමවේදයන්ට අනුව හැදෑරීමට සිසුවාට අවස්ථාව හිමි වෙයි. තෙවන වසර තුළ දී ප්‍රායෝගික පුහුණුව සඳහා දින හතරත් ද න්‍යායික පුහුණුව සඳහා එක් දිනක් ද වෙන් වෙයි.

ප්‍රායෝගික පුහුණුව සඳහා ආයතනයෙන් බැහැර වී ආයතනය විසින් අනුමත කරනු ලබන වැඩබිමක පුහුණුවීමට සිදු වෙයි. ආයතනය මගින් අනුමත වැඩබිම් අතර කීපයක් ලෙස බස් ඩිපෝ, ටොයොටා ලංකා පෞද්ගලික සමාගම, ශ්‍රී ලංකා ටෙලිකොම්, පාර්ලිමේන්තුව, සතොස, ට්‍රාන්ස් එයා, සෙන්ට්‍රල් ෆිනෑස්, කීල්ස් ආයතනය, වයඹ කුරුණෑගල යන්ත්‍රෝපකරණ අධිකාරිය, සිලෝන් වොක්ලට්, කෙසෙල් වත්ත ඒජන්සීස් සියරා දැක්විය හැකි ය. මෙහිදී සිසුන්ට ලැබෙන අමතර වාසි නම් බොහෝවිට සේව්‍යයාගෙන් දීමනාවක් හිමිවීම හා පුහුණුව සඳහා පදිංචි ප්‍රදේශය ආසන්නයෙන් ම වැඩ බිම හිමිවීමයි.

තෝරා ගත් පිරිසකට පළමු වසර තුළ දී න්‍යායික හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් පවත්වනු ලබයි. මෙහිදී කර්මාන්ත ශාලාවක භාවිත වන උපකරණ පිළිබඳ මූලික දැනුම ලබාදීම සිදු කරයි. මෙය ආයතනය තුළින් පවත්වන සියලු පාඨමාලා සඳහා මූලික දැනුම ලබා දෙන ක්‍රියාවලිය ලෙස හැඳින්විය යුතුය. එක් අවුරුදු පාඨමාලාවෙන් පසු පරීක්ෂණයක් පවත්වනු ලබයි.





සිව්වන වසර තුළ උකහා ගත් දැනුම රැකියා සඳහා උපයෝගී කරගන්නා අයුරු පෙන්වාදීම සිදු කරයි. යහපත් පැමිණීමක් සමඟ පූර්ණ කාලීන පාඨමාලාව සාර්ථකව හැදෑරූ සිසුන් හට පවත්වන අවසාන විභාගය ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය සහ ජාතික ආධුනිකත්ව මණ්ඩලය එක්ව පවත්වයි. විභාගයේ ප්‍රතිඵල වර්ගීකරණයට ලක් කරන අතර ආයතනයට දේශීයව, විදේශීයව ලැබෙන රැකියා පුරප්පාඩු සඳහා විශිෂ්ට සාමාර්ථතා ලැබුවනට ප්‍රමුඛත්වය ලබා දෙයි.

ලංකා ජර්මන් අභ්‍යාස ආයතනය විශිෂ්ටයන් හට රැකියා ලබා දී ඇති දේශීය ස්ථාන කීපයක් නම් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,B.M.W. ආයතනය, ටොයෙටා ලංකා සමාගම සහ සිංගර් ආයතනයයි. ඕස්ට්‍රේලියාව, කැනඩාව, මැදපෙරදිග හා යුරෝපා රටවල් වැඩි වශයෙන් ශ්‍රමිකයන් ඉල්ලුම් කරයි. ඕස්ට්‍රේලියාවේ මෙල්බන් නුවර පමණක් අභ්‍යාස ලාභීන් 1500 කට අධික පිරිසක් සේවය කරති.

පූර්ණ කාලීන පාඨමාලා හදරන්නන් හට පමණක් ආයතනයෙන් හිමිවන වරප්‍රසාද අතර ජීවිත රක්ෂණ ආවරණය, මාසිකව දෙනු ලබන රුපියල් 450 ක දීමනාව, ලංගම වාර ප්‍රවේශ පත්‍රය ප්‍රධාන වෙයි. සුබසාධන සමිතියක් ආයතනය තුළ ඇති අතර ජාතික, ආගමික, ක්‍රීඩා උත්සව මෙන්ම සීල ව්‍යාපාරයක් ද වාර්ෂිකව පවත්වයි. අසරණ සරණ සේවා සඳහා සිසුන් යොමු කිරීමට ද පාලක මණ්ඩලය කටයුතු කරයි.

## කෙටිකාලීන පාඨමාලා

අභ්‍යාසලාභීන් වැඩි පිරිසක් බිහි කිරීම උදෙසා ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය 1979 දී කෙටිකාලීන පාඨමාලා ආරම්භ කර ඇත. එක් වරකට අපේක්ෂකයන් දහස (1000) බැගින් වසරකට තුන් වතාවක් බඳවා ගනු ලබයි. මෙම පාඨමාලා පවත්වන කාල සීමාවන් මාස 4 1/2, මාස 6, අවුරුදු 1, අවුරුදු 2 යි මාස 4 1/2 ආදී වශයෙන් විවිධාකාර වේ. අධ්‍යාපන සුදුසුකම් ලෙස 9 වසර සමත්වීම ප්‍රමාණවත් වන අතර වයස අවුරුදු 16-45 අතර අයකුට පාඨමාලා සඳහා ඉල්ලුම් කළ හැකි ය. (පාඨමාලා ආරම්භයට මාස දෙකකට (02) පෙර පුවත්පත් දැන්වීමක් මඟින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

පාඨමාලා හැදෑරීමට සුදුසුකම් ලත් පිරිස හට තුන් මසක මූලික (කර්මාන්ත ශාලා) පුහුණුව ලබා දෙනු ලැබේ. එම පුහුණු පාඨමාලාවෙන් පසු පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එයින් සමත්වී පාඨමාලාවක් හැදෑරිය හැකි ය. තුන් මසකට වරක් පාඨමාලාව තිම වන තුරු පරීක්ෂණ පවත්වන අතර පාඨමාලාවේ අවසානය කරා යාමට නම් සියලු පරීක්ෂණයන් සමත් විය යුතු ය. සියලු පරීක්ෂණයන් සමත්වීම හා සාර්ථක පැමිණීම අවසන් පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට හේතු වෙයි. මෙහි දී ද විශිෂ්ට සාමාර්ථ ලැබූවන් හට දේශීය හා විදේශීය රැකියා සඳහා ආයතනය උපකාර කරයි.

# පාඨමාලා විස්තරය

**මෝටර් කාර්මික ශිල්පය**
* මෝටර් කාර්මික ශිල්පය
* මෝටර් සයිකල් තාක්ෂණය
*නවීන මෝටර් වාහන තාක්ෂණය
(සියළුම ස්වයංක්‍රීය ගියර් පෙට්ටි,
බල රෝධක හා ඉන්ධන විදුම් ක්‍රම)

**බල විදුලි ශිල්පය**
* විදුලි කම්බි සවි කිරීම
* විදුලි නඩත්තුව

**වායු සමීකරණ හා ශීතකරන ශිල්පය**
* වායු සමීකරණ හා ශීතකරණ ශිල්පය
* ඉලෙක්ට්‍රොනික් විද්‍යාව

**වාහන විදුලි ශිල්පය**
* වාහන විදුලි ශිල්පය
* වාහන විද්‍යුත් ඉලෙක්ට්‍රොනික් ශිල්පය

**යන්ත්‍රණ ශිල්පය**
* යන්ත්‍ර ශිල්පය
* මිලිං හා ගාන පට්ටල් ශිල්පය

ගියර් මිලිං ශිල්පය
C.N.C. තාක්ෂණය
*** වෙල්ඩින් ශිල්පය**
* වායු වෙල්ඩින් ශිල්පය
* විද්‍යුත් චාප වෙල්ඩින් ශිල්පය
වායු හා වි. චාප වෙල්ඩින් ශිල්පය

**සැලසුම් ශිල්පය**
* යාන්ත්‍රික සැලසුම් ශිල්පය
* ගෘහ සැලසුම් ශිල්පය

**යන්ත්‍රෝපකරණ අලුත් වැඩියාව හා නඩත්තුව**
* ද්‍රව හා වායු පීඩන ශිල්පය
(යඩ්‍රොලික් හා නියුමැටික් තාක්ෂණය)
* යන්ත්‍ර අලුත්වැඩියාව හා නඩත්තුව
ඉන්ධන පොම්ප කාර්මික ශිල්පය

## පුහුණු කිරීමේ ක්‍රියාවලිය

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය 175 ක් ය. ආයතනයේ පූර්ණකාලීන පාඨමාලාව හැදෑරුවන් ගුරු මණ්ඩලයට අයත් වේ. ඔවුන් ජාතික තාක්ෂණ සහතික පත්‍ර ලැබූවන්වීම ද අනිවාර්ය ය. මීට අමතරව විදේශයන් මඟින් හිමි ශිෂ්‍යත්ව හැදෑරීමෙන් තම දැනුම වර්ධනය කර ගනී. ජර්මන් රජයෙන් එක් අවුරුදු, දෑ අවුරුදු පාඨමාලා සඳහා සියයකට අධික නිලධාරීන් පිරිසකට ශිෂ්‍යත්ව ලබා දී ඇති අතරම ජර්මන් "Metzigen" වෘත්තීය පුහුණු ආයතනය සමඟ ජර්මන් ටෙක් සහයෝගිතා පදනම සම්මන්ත්‍රණ ද පවත්වා ඇත. එලෙස දැනුමින් පිරිපුන් උපදේශකයන් නවීන පර්යේෂණාගාර පහසුකම්, සියලු අංගෝපාංගවලින් සමන්විත නවීන කර්මාන්ත ශාලා තුළ තම බුද්ධිමය දේපළ බෙදා හරියි.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය ආරම්භ කිරීමේ සිට නිරතුරු සහයෝගිකව කටයුතු කරන ජර්මන් රජය මෑතක දී CNC (අධි තාක්ෂණික උපකරණ මඟින් යන්ත්‍ර පාලනය කිරීම) තාක්ෂණ පාඨමාලාව ආරමං කිරීම සඳහා රුපියල් ලක්ෂ 500 වටිනා නවීන යන්ත්‍ර උපකරණ ලබා දෙනු ලැබී ය.

මෙලෙස නව සොයා ගැනීම් සමඟ ඉදිරියට යන ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය අනාගත අවශ්‍යතා මත තම පාඨමාලාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වෙයි.

පැහැබර අනාගතයක් උදෙසා සාම්ප්‍රදායිකත්වයෙන් මිදී නව ලොව නව ඇසකින් බැලීමට, නවයුගයකට පියනැගීමට ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මහඟු අත්වැලක් සපයන බව නොරහසකි.

මෙම ලිපිය සැකසීමේ දී විදුහල්පතිතුමා මෙන්ම ලේඛකාධිකාරී එඩ්වඩ් ද සිල්වා මහතා, නිලධාරිනී බියන්කා දර්ශනී මහත්මිය ජ්‍යෙෂ්ට උපදේශක සෝමපාල මහතා යන අය දැක් වූ සහයෝගය අගය කළ යුතු ය. ❑

**ඒ. ඒ පුබුදු කිත්සිරි**